## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024**

**2026 ජූලි / අගෝස්තු**

**සමාජීය විද්‍යා පීඨය**

## පුරාවිද්‍යාව

**පුරාවිද්‍යාවේ ඉතිහාසය - ARCH 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අ) පුරාවිද්‍යාව යන විෂයෙහි අර්ථය පැහැදිලි කර, එය විද්‍යාත්මක විෂයයක් ලෙස සැලකීමට හේතු සාකච්ඡා කරන්න. (ලකුණු 08)

    ආ) පුරාවිද්‍යා විෂය පෝෂණය සඳහා අනෙකුත් විෂයයන්ගෙන් ලැබෙන දායකත්වය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

02. අ) ශ්‍රී ලංකාවේ විධිමත් පුරාවිද්‍යාත්මක කටයුතු ආරම්භ වීමට පෙර බ්‍රිතාන්‍ය පාලන සමයේ මුල් අවධියේ දී මෙරට පෞරාණික ස්ථාන කෙරෙහි රාජ්‍ය නිලධාරීන්ගේ අවධානය යොමු වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

    ආ) වර්ෂ 1980 දශකයෙන් පසු මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවීම නිසා මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රය ලැබූ ප්‍රගතිය අගය කරන්න. (ලකුණු 10)

03. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ පුරාවිද්‍යාත්මක සහ ශිලාලේඛන පර්යේෂණ ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනයට කළ බලපෑම විග්‍රහ කරන්න. (ලකුණු 20)

04. ශ්‍රී ලංකාවේ පළමු පුරාවිද්‍යා කොමසාරිස් වූ එච්.සී.පී. බෙල් (H.C.P. Bell) ගෙන් මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සිදු වූ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 20)

05. "සමකාලීන ශිෂ්ටාචාර අතරින් දකුණු ආසියාව තුළ පැනනැගුණ නාගරික සභ්‍යත්වයක් සහිත ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි." නිදර්ශන දක්වමින් මෙම කියමන පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. "නූතන පුරාවිද්‍යාව යනු හුදෙක් සමාජීය විද්‍යාවන්ගෙන් පමණක් නොව ස්වභාවික විද්‍යාවන්හි දියුණුව මත ගොඩනැගුණ බහු විෂයාත්මක (Multi- disciplineary) විෂය ක්ෂේත්‍රයකි." ශ්‍රී ලංකාවේ ප්‍රාග් හා පූර්ව ඓතිහාසික පර්යේෂණ ඇසුරෙන් මේ ප්‍රකාශය විග්‍රහ කරන්න. (ලකුණු 20)

07. සර් මෝටිමර් වීලර් (Sir Mortimer Wheeler) මහතා විසින් සිදුකළ පර්යේෂණ ඉන්දියානු පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ වර්ධනයට බලපෑ ආකාරය නිදර්ශන දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

(අ.පි.බ.)

08. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකකට (02) ප්‍රමාණවත් කෙටි සටහන් ලියන්න.

i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ නාගරික ලක්ෂණ

ii. චාල්ස් ඩාවින්ගේ පරිණාමවාදී න්‍යාය පුරාවිද්‍යාවට සිදු කළ බලපෑම

iii. ආචාර්ය ශිරාන් දැරණියගල මහතාගේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ

iv. සීගිරිය පැරණි නගරයේ සැලැස්ම

v. ඇලෙක්සැන්ඩර් කනිංහැම් (Alexander Cunningham) මහතාගේ පුරාවිද්‍යා පර්යේෂණ

(ලකුණු 20)

**********************************